2026-03-16 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල

රැස්වීමේදී ඵළඹුණු තීරණ

01. ඉන්දීය රජයේ ප්‍රදානයක් යටතේ ධීවර ක්ෂේත්‍රයේ රාජකාරී කටයුතුවල නියැළෙන ක්ෂේත්‍ර නිලධාරීන්ට විදුලි යතුරු පැදි ලබා දීම

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ක්ෂේත්‍ර පර්යේෂණ සහායකයින් විසින් සිදු කරනු ලබනි රාජකාරී, වඩා ඵලදායීව, කාර්යක්ෂමව සහ කෘත්තිමත්ව ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම කෙරෙහි රජයේ සුවිශේෂී අවධානය යොමුව තිබේ. ඒ අනුව, ඔවුන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් බාධාවකින් තොරව ඇලෑසීමේ අරමුණ සහිතව 2026 වර්ෂයේදී ධීවර ඈයේ ක්ෂේත්‍ර මට්ටමේ රාජකාරිවල නිරත නිලධාරීන් 430දෙනෙකු වෙත විදුලි යතුරු පැදි ලබා දීමට සැලසුම් කර ඇත. එම යතුරු පැදි මිල දී ගැනීම සඳහා අදාළ පිරිවැය වන ශ්‍රී ලංකා රුපියල් මිලියන 264.59ක මුදල ඉන්දියානු රජය විසින් මූල්‍ය ප්‍රදානයක් ලෙස ලබා දීමට එකඟතාව පළ කරනු ලැබ තිබේ. ඒ අනුව, එකී ප්‍රදානය ලබා ගැනීම සඳහා ඉන්දියානු රජය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. eZCash සහ mCash මුදල් හුවමාරු කිරීමේ ක්‍රම යොදා ගනිමින් මත්ද්‍රව්‍ය ජාවාරම් සහ සංවිධානාත්මක අපරාධවලට අදාළව මුදල් හුවමාරු කරනු ලබන පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීම

eZCash සහ mCash මුදල් හුවමාරු කිරීමේ ක්‍රම, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ සංවිධානාත්මක අපරාධවලට අදාළ මුදල් ගනුදෙනු සඳහා අනාවශ්‍යතාව අනාවරණය නොවන ලෙස බහුලව භාවිත කෙරෙන බව නිරීක්ෂණය කරනු ලැබ ඇත. එවැනි ගනුදෙනුවල නිරත වන පුද්ගලයින් නීතියේ රැහැනට හසු කර ගැනීම සම්බන්ධයෙන් ගත යුතු පියවරයන් පිළිබඳව නිර්දේශ සහිත වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුක්තව කමිටුවක් පත් කිරීම සඳහා මීට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, එකී කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා පොලිසිය සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කරමින් සකස් කරනු ලබන දත්ත පද්ධතියක් හරහා අදාළ නීති විරෝධී කටයුතු වැළැක්වීමට සහ එවැනි

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො T - (+94 11) 2515759
ෆැ පෙ F - (+94 11) 2514753
ඊ මි E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

කටයුතුවල යෙදෙන පුද්ගලයින් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. ජල පරිසරය පසු විපරම් කිරීම සහ දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා විශාල දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම මගින් කාර්මික අපජලය බැහැර කිරීම නියාමනය කරනු ලබයි. ඒ අනුව, කැලණි ගඟේ ජල තත්ත්ව පසු විපරම් වැඩසටහන මගින් විශාල දත්ත ප්‍රමාණයක් රැස් කර ගෙන ඇති අතර, ඒවා ඇගයීම් කර තීරණ ගැනීම සඳහා භාවිත කිරීමට හැකියාව පවතී. එහෙත්, ඒ සඳහා ප්‍රමාණවත් පුහුණු නිලධාරීන් නොමැති. වීම සහ පසු විපරම් දත්ත විශ්ලේෂණය හා පුරෝකථනය සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම හේතුවෙන් අපජලය මුදාහැරීමේ නියම තත්ත්ව පසු විපරම් කිරීම සහ දූෂකවල නිශ්චිත ප්‍රභවයන් හඳුනා ගැනීම අභියෝගාත්මක කාර්යයක් වී ඇත. එම තත්ත්වය සැලකිල්ලට ගනිමින්, මධ්‍යම පරිසර අධිකාරිය, මොරටුව විශ්වවිද්‍යාලය සහ ජපානයේ ටොහොකු විශ්වවිද්‍යාලය විසින් හවුල් පර්යේෂණ ව්‍යාපෘතියක් වශයෙන් 'ජල පරිසරය පසු විපරම් කිරීම සහ දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා විශාල දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම' යන මැයෙන් ව්‍යාපෘති යෝජනාවක් තිරසර සංවර්ධනය සඳහා වන විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ හවුල්කාරිත්ව වැඩසටහන යටතේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය වෙත ඉදිරිපත් කරනු ලැබ තිබේ. එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 646ක ප්‍රදානයක් ලබා දීමට ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් එකඟතාව පළ කර ඇත. ඒ අනුව, එකී ප්‍රදානය ලබා ගෙන යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල, කලාප අධ්‍යාපන කාර්යාලවල හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල පවතින භෞතික හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා උපකරණ සපයා දීම

ඇතැම් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල, කලාප අධ්‍යාපන කාර්යාලවල හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල පවතින භෞතික හා යටිතල පහසුකම් පැරණි සහ ඕමත වීම හේතුවෙන් ගුරුවරුන් සහ සිසුන් යන දෙපාර්ශ්වයටම සිය අධ්‍යාපන ක්‍රියාකාරකම් කාර්යක්ෂමව ඉටු කිරීමට බාධාවන් සිදු වන බව නිරීක්ෂණය වී තිබේ. රජයේ නව අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව අධ්‍යාපන පද්ධතියේ භෞතික හා

යටිතල පහසුකම් සහ කාර්යාල ව්‍යූහ ශක්තිමත් කිරීම තුළින් සේවා සැපයීමේ කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ සේවක තෘප්තිය ඉහළ නැංවීමත්, එමඟින් ශිෂ්‍ය ප්‍රජාව වෙත ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහතික කිරීමත්, අධ්‍යාපන පද්ධතිය තුළ සම්පත් බෙදී යාමේ විෂමතාව අවම කිරීමත් අරමුණු කර ගනිමින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල, කලාප අධ්‍යාපන කාර්යාලවල හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල භෞතික හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ උපකරණ ලබා දීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. රුපියල් මිලියන 1,264ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ 2026 සිට 2028 වර්ෂය දක්වා වසර 03ක කාලයක් තුළ අදාළ පළාත් සහ සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා ඍත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **මාලදිවයිනේ මාලේ ගුවන්තොටුපොළෙහිදී ශ්‍රීලංකන් ගුවන් සේවයේ ගුවන් යානා සඳහා බිම් මෙහෙවර සේවා සපයා ගැනීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

මාලේ ගුවන්තොටුපොළෙහිදී ශ්‍රීලංකන් ගුවන් සේවයේ ගුවන් යානා සඳහා බිම් මෙහෙවර සේවා සපයා ගැනීමේ වර්තමාන කොන්ත්‍රාත්තුව 2026-03-31 දිනෙන් අවසන් වීමට නියමිත ය. ඒ අනුව, එකී සේවාවන් සපයා ගැනීම පිණිස එම ගුවන්තොටුපොළෙහි බිම් මෙහෙවර සේවා සපයනු ලබන එකම සේවා සැපයුම්කරුගෙන් යෝජනාවක් ලබා ගෙන ඇත. එම යෝජනාව ඇගයීමෙන් අනතුරුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව 2026-04-01 දින සිට වසර 03ක කාලසීමාවක් සඳහා බිම් මෙහෙවර සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව Maldives Airport company Limited වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 16.19ක මුදලකට පිරිනැමීම පිණිස වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **මන්නාරම ග්‍රිඩ් උපපොළේ සිට මුල්ලිකුලම් රෑස් කිරීමේ ග්‍රිඩ් උපපොළ දක්වා ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය ඉදිකිරීම**

මුල්ලිකුලම් සුළං විදුලි සම්ප්‍රේෂණ ව්‍යාපෘතියේ ලොට් B යටතේ මන්නාරම ග්‍රිඩ් උපපොළේ සිට මුල්ලිකුලම් රෑස් කිරීමේ ග්‍රිඩ් උපපොළ දක්වා කිලෝමීටර 28ක් දිගින් යුත් කිලෝවෝල්ට් 220ක ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම පිණිස විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා 2025-02-03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුව ලංසු කැඳවා ඇති අතර, ලංසු 05ක් ඉදිරිපත් වී තිබේ. එකී ලංසු ඇගයීමෙන්

අනාතුරුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරාත්මකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන JSL & Fentons Joint Venture - Intend (Jyoti Structure Limited, India and Hayleys Fentons Limited , Sri Lanka) වෙත ශ්‍රී ලංකා රුපියල් මිලියන 2,269.18කට සමාන මුදලකට (බදු රහිත) එකී කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස බලශක්ති අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **2024 අංක 1 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ - තීරුබදු රහිත මෙහෙයුම්) නියෝග සංශෝධනය කිරීම**

අනුමත වාර්ෂික තීරු බදු ගිම්හකම ඇමෙරිකානු ඩොලර් 2,000ක සීමාව සංශෝධනය කිරීමකින් තොරව කොළඹ වරාය නගරයේ තීරු බදු රහිත සාප්පු සංකීර්ණයෙන් හාණ්ඩ මිල දී ගැනීම සඳහා විදේශයක සිට මෙරටට පැමිණෙන මගියෙකුට මෙරටට පැමිණි දින සිට දින 4ක් තුළ අවස්ථා දෙකකදී ඉඩ සලසා දීමට හැකිවන පරිදි අදාළ නියෝග සංශෝධනය කිරීම පිණිස 2025-12-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, අංක 2475/28 හා 2026-02-13 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සංශෝධිත නියෝග, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති මගී සේවා අවසර පත්‍රවල අයිතිය පැවරීමේ නියෝග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව යම් තැනැත්තෙකු වෙත ප්‍රදානය කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් වෙනත් අයෙකුට පැවරිය නොහැකි වීමත්, එවන් පැවරීමක් ශූන්‍ය හා බල රහිත වීමත් හේතුවෙන් බස් රථ හිමියන්ට මෙන්ම ජාතික ගමනාගමන කොමිෂන් සභාවට මුහුණ පෑමට සිදු වූ ගැටලු සැලකිල්ලට ගෙන, 2025 අංක 8 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මඟින් එකී ප්‍රතිපාදන සංශෝධනය කිරීමට පියවර ගනු ලැබ ඇත. ඒ අනුව, මගී සේවා අවසර පත්‍රයක් පැවරීම සඳහා අදාළ විය යුතු නීතිමය නිර්ණායක ඇතුළත් කරමින්, ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ විධිවිධාන පරිදි සාදන ලද, අංක 2471/68 දරන 2026-01-07 දිනැති

අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ ඇති 2026 අංක 1 දරන මගී සේවා අවසර පත්‍ර පැවරීමේ නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ යාදන ලද නියෝග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සියලුම මෝටර් වාහන සඳහා නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 50,000ක් දක්වා වන විශේෂ අංක වෙන් කරවා ගැනීමට අදාළ ගාස්තු සඳහා අදාළ වන නියෝග 2023-10-05 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එම නියෝග සංශෝධනය කරමින් මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වැන් රථ හැර වෙනත් සියලුම මෝටර් වාහන සඳහා නිකුත් කරනු ලබන අංකවලින් 50,000න් ඉදිරියට 100,000ක් දක්වා විශේෂ අංක වෙන් කිරීමට හා එම එක් අංකයක් වෙනුවෙන් රුපියල් 1,000,000/-ක ගාස්තුවක් අය කිරීමට හැකි වන පරිදි නෛතික ප්‍රතිපාදන සැලසීම පිණිස අංක 2470/14 හා 2026-01-05 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් නියෝග ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. ඒ අනුව, එකී නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **(218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත සංශෝධනය කිරීම**

අත්අඩංගුවේ පවතින අන්තරායකර ඖෂධ බැහැර කිරීම සඳහා මෙන්ම ඉදිරියේදී අත්අඩංගුවට ගනු ලබන මත්ද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාපටිපාටිය ද ඇතුළත්ව, සාක්ෂි සඳහා ආදර්ශක සාම්පලයක් පමණක් රඳවා ගැනීමෙන් අනතුරුව නඩු විභාගය අවසන් වීමට පෙර අත්අඩංගුවේ පවතින මත්ද්‍රව්‍ය බැහැර කිරීම පිණිස නීති හදුන්වා දීම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට 2026-01-12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමෙදී අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් නිලධාරී කමිටුවක් පත් කිරීමට අනුමැතිය ලබා දී ඇත. එම කමිටුව විසින් සියලු පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සහතික කරමින් එවැනි මත්ද්‍රව්‍ය කඩිනමින් විනාශ කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනතේ 77 අ වගන්තිය සඳහා හඳුනාගෙන ඇති සංශෝධන ඇතුළත් කරමින්, නීති කෙටුම්පත් සම්පාදක විසින් මූලික පනත් කෙටුම්පතක් සකස් කරනු ලැබ තිබේ. ඒ අනුව, එකී ආඥාපනත

සංශෝධනය කිරීම සඳහා වන අවශ්‍යතා පනත් කෙටුම්පත භාෂාත්‍රයෙන් යකඩ් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ විධිවිධාන යටතේ නියෝග සෑදීම

නීති විරෝධී ලෙස ප්‍රයෝජනයට ගත් පුරාවස්තු ආපසු ලබා ගැනීමට හෝ ස්ථාන හා පුරාවස්තු ආරක්ෂා කිරීමට හෝ දායක වන තොරතුරු සපයන්නන් සහ ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් අභිප්‍රේරණය කිරීම පිණිස තෑගි දීමේ කාර්ය සඳහා 'පුරාවස්තු තෑගි අරමුදල' භාවිත කිරීමට හැකියාව පවතී. ඒ අනුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු පාර්ශ්වකාර ආයතනවල කාර්යමණ්ඩල සාමාජිකයින් කවදුරටත් අභිප්‍රේරණය කිරීම සහ දිරිගැන්වීම සඳහා පුරාවස්තු තෑගි අරමුදල භාවිත කරමින් ප්‍රතිශතාත්මකව යම් දීමනාවක් ගෙවීමේ වැදගත්කම හඳුනා ගනු ලැබ තිබේ. ඒ සඳහා (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 46 වන වගන්තියේ හා 47 වන වගන්තියේ විධිවිධාන යටතේ පුරාවස්තු තෑගි අරමුදල නියෝග කෙටුම්පත් කරනු ලැබ ඇත. එකී කෙටුම්පත් නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් ඉන් අනතුරුව, ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමටත් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත සංශෝධනය කිරීම

ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ආගමික ස්මාරක සංවර්ධනය කිරීම, දේශීය හා විදේශීය සංස්කෘතික ස්මාරක සංවර්ධනය, ප්‍රතිසංස්කරණය කිරීම හා ආරක්ෂා කිරීම, සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීම ආදී කාර්යයන් සඳහා දරන ලද වියදම් පියවීම, කලාකරුවන්ට මුදලින් ආධාර පිරිනැමීම මෙන්ම සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රයන්හි ජාතිය වෙනුවෙන් සේවය කළ තැනැත්තන්ට ප්‍රදානයන් සිදු කිරීම යන කටයුතු 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ විධිවිධාන යටතේ පිහිටුවනු ලැබ ඇති මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සිදු කරනු ලබයි. එකී පනත පාර්ලිමේන්තුවේ සම්මත වී මේ වන විට වසර 45කට වැඩි කාලයක් ගත වී ඇති අතර, එහි ඇතුළත් විධිවිධාන වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සැලකිල්ලට ගෙන, එකී පනත සංශෝධනය කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දෙන ලදී.

13. **2026 වසර සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති සාදක ණය ලබා ගැනීම**

ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම වැඩසටහනට සමගාමීව ශ්‍රී ලංකාවේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම සඳහා ප්‍රතිපත්ති පාදක ණය ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව සිය එකඟතාව ලබා දී තිබේ. ඒ අනුව, පහත දැක්වෙන උප වැඩසටහන් 05 යටතේ ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 620ක් සම්පාදනය කර ගැනීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* වෙළඳ, ආයෝජන සහ කර්මාන්ත සංවර්ධන වැඩසටහන - ඇමෙරිකානු ඩොලර් මිලියන 100

* ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශක්තිමත් සහ ඇතුළත් මුල්‍ය පසුබිමක් ගොඩනැගීමේ වැඩසටහන - ඇමෙරිකානු ඩොලර් මිලියන 220

* ජල සම්පාදන හා සනීපාරක්ෂක ප්‍රතිසංස්කරණ වැඩසටහන - ඇමෙරිකානු ඩොලර් මිලියන 100

* ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය සහ සමාවේගී ප්‍රතිසාධනය සඳහා අවස්ථාව ලබා දීමේ සංවර්ධන වැඩසටහන - ඇමෙරිකානු ඩොලර් මිලියන 100

* කෘෂිකාර්මික වටිනාකම් දාම මුල්‍යකරණය සහ වාණිජකරණ අංශ සංවර්ධන ව්‍යාපෘතිය - ඇමෙරිකානු ඩොලර් මිලියන 100

14. **'ජාතික නාමල් උයන' ජාතික උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

ශ්‍රී ලංකාවේ විශාලතම නා වනාන්තරය ලෙස සැලකෙන, සංරක්ෂිත වනාන්තරයක් බවට ප්‍රකාශයට පත් කොට ඇති, හෙක්ටයාර 602ක පමණ භූමි ප්‍රමාණයක පැතිරී පවතින 'ජාතික නාමල් උයන', ශ්‍රී ලංකාවේ වැදගත්ම හා ඓතිහාසික පුරාවිද්‍යාත්මක වටිනාකම්වලින් යුත් ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත. නාමල් උයනෙහි පිහිටි රෝස තිරුවාණා කඳුවැටිය ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් භූ-ජීවභෞතික උරුමයක් වේ. රෝස තිරුවාණා කඳුවැටියට අනන්‍ය වූ ඛනිජ හා විද්‍යාත්මක වටිනාකම්වලින් යුතු ලක්ෂණ, විශේෂිත විශාල වනාන්තර පරිසර පද්ධතිය සහ පුරාණ බෞද්ධ ආරාමවල භූ දර්ශන යන සියලු සාධක දිගුකාලීන සංස්කෘතික සම්බන්ධතා සමඟ සම්බන්ධ වී භූවිද්‍යාත්මක, පාරිසරික සහ සංස්කෘතික උරුම වටිනාකම්වල දුර්ලභ එකතුවක් ලෙස සලකමින් ජාතික නාමල් උයන, ජාතික උරුමයක් ලෙස ප්‍රකාශයට

පත් කිරීම යෝග්‍ය බව ශ්‍රී ලංකාවේ ජාතික උරුම හඳුනා ගැනීම සඳහා වන විද්වත් අනු කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ ඇත. එකී නිර්දේශය මත පදනම්ව, 'ජාතික නාමල් උයන' ජාතික උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. ආර්ථික කටයුතු යථාවත් කිරීම සඳහා අයික්‍යෂණ කමිටු පිහිටුවීම

මැදපෙරදිග කලාපයේ පවතින යුධමය වාතාවරණය හේතුවෙන් අස්ථාවර ගෝලීය පරිසරයක් නිර්මාණය වීම මත කුඩා ප්‍රමාණයේ විවෘත ආර්ථිකයක් සහිත රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයන් විවිධ බලපෑම්වලට නිරාවරණය වී ඇත. එබැවින්, ශ්‍රී ලංකාවට බලපාන අනපේක්ෂිත අවදානම් සම්බන්ධයෙන් කඩිනම් හා ප්‍රගතිශීලී පියවරයන් ගැනීම, වෙළෙඳපොළ තත්ත්වයන් ස්ථාවර කිරීම සහ පුරවැසියන්ගේ දෛනික ජීවිතය පවත්වාගෙන යාම සුරක්ෂිත කිරීමට කාලෝචිත මැදිහත්වීම් කඩිනමින් සිදු කිරීම අත්‍යවශ්‍ය වී තිබේ. ඒ අනුව, ආර්ථික ආවේක්ෂණ කමිටුව සමඟ එක්ව, ගෝලීය අස්ථාවරත්වය හේතුවෙන් දේශීය ආර්ථිකයට හා ජන ජීවිතයට එල්ල වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ගත යුතු ක්ෂණික පියවර සම්බන්ධයෙන් යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් පරිදි කමිටු 04ක් පිහිටුවීම සඳහා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

කමිටුව	කාර්යයන්
බලශක්ති කමිටුව - විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ඇමතිතුමාගේ සභාපතිත්වය යටතේ	ඉන්ධන, ගෑස් සහ ගල් අඟුරු සැපයුම් ස්ථාවරව පවත්වාගෙන යාමට අදාළ හදිසි මිල දී ගැනීම් සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම, සැපයුම් මූලාශ්‍රයන් සහ නව සැපයුම්කරුවන් හඳුනාගැනීම
රාජ්‍ය සේවය ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා වන කමිටුව - අග්‍රාමාත්‍යතුමියගේ සභාපතිත්වය යටතේ	රාජ්‍ය සේවය අඛණ්ඩව, කාර්යක්ෂමව හා ක්‍රමානුකූලව පවත්වා ගනිමින් ආර්ථික කටයුතු පවත්වා ගැනීමට මෙන්ම මහජනතාව සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා කඩිනමින් තීරණ ගැනීම

අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීම් අධීක්ෂණය සඳහා වන කමිටුව - ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන ඇමතිතුමාගේ සභාපතිත්වය යටතේ	අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීමේ රාජ්‍ය හා පුද්ගලික සැපයුම් දාමයන් අඛණ්ඩව පවත්වා ගනිමින් මහජනයාට වෙළෙඳපොළ සිහයකින් තොරව සාධාරණ මිලට භාණ්ඩ සැපයීම තහවුරු කිරීම
විවිධ සමාජ ස්ථරයන් සඳහා සුබසාධනය සැලසීම සඳහා වන කමිටුව - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් ඇමතිතුමාගේ සභාපතිත්වය යටතේ	දෛනික ජන ජීවිතයේ ඇති වන ගැටලු සහ බලපෑම් ක්ෂණිකව හඳුනාගෙන අවශ්‍ය ආපතන සමඟ සම්බන්ධීකරණයෙන් ඒ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම

16. නොරොච්චෝලේ ලක්විජය බලාගාරය සඳහා ගල් අඟුරු සපයා ගැනීමේ හදිසි ප්‍රසම්පාදනය

නොරොච්චෝලේ ලක්විජය බලාගාරය වෙත ගල් අඟුරු මෙට්‍රික්ටොන් 300,000±10% (නැවගත කිරීම් 05ක්) හදිසි ප්‍රසම්පාදනයක් ලෙස සපයා ගැනීම පිණිස 2026-01-26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම යටතේ ලියාපදිංචි වී සිටින ගල් අඟුරු සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 06ක් ලැබී තිබේ. එකී ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරාංශකුලව ප්‍රතිවාරාත්මක අවම ලංසුකරු වන ඉන්දියාවේ M/s. Taranjot Resources (Pvt) Ltd වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස බලශක්ති අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. ඛනිජතෙල් හා ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදන, ද්‍රව පෙට්‍රෝලියම් වායුව (LP ගෑස්) සහ ගල් අඟුරු ප්‍රසම්පාදනය

මැදපෙරදිග කලාපයේ උත්සන්න වෙමින් පවතින භූ-දේශපාලනික නොසන්සුන්තාව සහ සන්නද්ධ ගැටුම් හේතුවෙන් ගෝලීය බලශක්ති වෙළෙඳපොළ මේ වන විට දැඩි අස්ථාවරත්වයකට පත්ව ඇත. ශ්‍රී ලංකාව ආනයනික ඛනිජතෙල් හා ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදන, ද්‍රව පෙට්‍රෝලියම් වායුව (LP ගෑස්) සහ ගල් අඟුරු මත සම්පූර්ණයෙන්ම යැපෙන බැවින්, එම තත්ත්වය රටේ බලශක්ති සැපයුමට සහ

සුරක්ෂිතතාවට සෘජු හා ක්ෂණික බලපෑමක් සිදු කර තිබේ. පවතින ගැටුම්වල සෘජු ප්‍රතිඵලයක් ලෙස නැව්ගත කිරීම් අවලංගු වීම, රක්ෂණ සේවා සපයන්නන් රක්ෂණාවරණ ලබා දීම ප්‍රතික්ෂේප කිරීම, සැපයුම්කරුවන් දිගුකාලීන ගිවිසුම්වලට එළඹීමට අකමැත්තක් දැක්වීම ආදී හේතූන් මත අඛණ්ඩ බලශක්ති සැපයුම් සහතික කිරීම සඳහා තාවකාලික සහ නම්‍යශීලී ප්‍රසම්පාදන රාමුවක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වී ඇත. ඒ අනුව, ඉදිරියේදී පැන නැගෙන තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විමසමින්, මාස 03ක කාලයක් සඳහා සම්මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් පරිබාහිරව ඛනිජතෙල් හා ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදන, ද්‍රව පෙට්‍රෝලියම් වායුව (LP ගෑස්) සහ ගල් අඟුරු ප්‍රසම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **පවතින ඉන්ධන අර්බුදයට විසඳුමක් වශයෙන් සතියේ බදාදා දින රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

මැදපෙරදිග කලාපයේ ඇති වී තිබෙන යුධමය තත්ත්වය හේතුවෙන් පැන නැගී ඇති ඉන්ධන සපයාගැනීමේ ගැටලුවට තාවකාලික විසඳුමක් වශයෙන් රජයේ කාර්යාල විවෘතව පවතින දින ගණන සීමා කිරීමේ යෝග්‍යතාව පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු විය. ඒ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, දැනට පවතින ඉන්ධන තොග අරපිරිමැස්මෙන් භාවිත කිරීමට සහ ඉදිරියේදී ඉන්ධන තොග සපයාගැනීමේ අවිනිශ්චිත තත්ත්වයට මුහුණ දීමට හැකි වන අයුරින් වහාම ක්‍රියාත්මක වන පරිදි සතියේ බදාදා දින රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමටත්, ඊට අදාළව සවිස්තරාත්මක චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ට බලය පැවරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

****